බිඑෆ්/එෆ්පිඑෆ්/01/2013 (64)

අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය
කොළඹ

සියළුම ලැයිස්තු (ශ්‍රීලංනාහ හා ශ්‍රීලංගුහ හැර)

2013 නොවැම්බර් 20

**යුද්ධ හමුදා මුදල් (රාජ්‍ය නොවන මුදල්) මගින් පවත්වාගෙන යන ගිණුම් සඳහා මුදල් කපාහැරීමේ නව සීමාවන් හඳුන්වාදීම**

යොමුව:
අ. බිඑෆ්/එෆ්පිඑෆ්/01/2011 (19) හා 2011.03.29 දිනැති අයවැය හා මුපඅම ලිපිය.

1. යුද්ධ හමුදා මුදල් (මහජන මුදල් නොවන) පරිහරණය සම්බන්ධයෙන් මුදල් කපා හැරීමට යොමුගත ලිපිය මගින් ලබාදී ඇති සීමාවන් 2013.11.20 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් අයුරු සංශෝධනය කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

| මුදල් කපාහැරීමේ සීමාවන් හිමි ආයතන ප්‍රධානීන් | අනුමත කපාහැරීමේ සීමාවන් |
|---|---|
| ඒකක අණදෙන නිලධාරී | වරකට රු. 10,000.00 බැගින් කාර්තුවකට රු. 75,000.00 දක්වා |
| සේනාවිධායක - රණවිරු ඇපරල් ආයතන/සේනාවිධායක - අභිමංසල/ සේනාවිධායක - රණවිරු සම්පත් කේන්ද්‍රය/ අධ්‍යක්ෂ - සෙනෙහස පර්යේෂණ තොරතුරු කේන්ද්‍රය /සේනාවිධායක - මිහිඳු සෙත් මැඳුර | වරකට රු. 10,000.00 බැගින් කාර්තුවකට රු. 75,000.00 දක්වා |
| බළසේනාධිපති/මධ්‍යස්ථාන සේනාවිධායක/ පුහුණු පාසල් සේනාවිධායක (යුහවිපි හැර) | වරකට රු. 20,000.00 බැගින් කාර්තුවකට රු. 100,000.00 දක්වා |
| සේනාවිධායක - යුද්ධ හමුදා විද්‍යාපීඨය (දියතලාව) | වරකට රු. 25,000.00 බැගින් කාර්තුවකට රු. 150,000.00 දක්වා |
| ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු/ප්‍රධාන සංඥා නිලධාරී/ඉදිරි නඩත්තු පෙදෙස් අණදෙපති/සේනාංකාධිපති | කාර්තුවකට රු. 250,000.00 දක්වා |
| ආඥාපති - පුහුණු අණසක/සේනාවිධායක - ශ්‍රීලංයුහසෙව්බමු/ ආරක්ෂක සේනා ආඥාපති/ආඥාපති - හකාස අණසක/ රෙජිමේන්තු අධිපති/බලකාධිපති | කාර්තුවකට රු. 500,000.00 දක්වා |

2. මුදල් වැය කිරීමේදී ඉහත ලබාදී ඇති වියදම් සීමාව තුල නිසි අධීක්ෂණයකින් හා මනා පාලනයකින් යුතුව ක්‍රියාකිරීමට ආයතන ප්‍රධානීන් පියවර ගත යුතු වේ. ඉහත සඳහන් මුදල් වියදම් කිරීමේ සීමාවන් ඉක්මවා මුදල් වැය නොකිරීමට සියළුම මූලස්ථාන/ආයතන විසින් වගබලා ගත යුතු බව යුද්ධ හමුදාධිපති විසින් විධානය කර ඇති බව කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

3. යොමුගත ලිපිය මගින් නිකුත් කර ඇති උපදෙස් මින් අහිබවනය වේ.

ඩබ්ලිව්ආර් පලිහක්කාර යුඑස්පි
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂ අයවැය හා මුදල් පරිපාලන